# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/51 – 2018 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා – 2018.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 2047/13 හා 2017.11.28 වැනි දින දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2017 අංක 309 හා 2017.11.22 දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් එහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2047/13 හා 2017.11.28 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2017 අංක 309 හා 2017.11.22 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/VE/363
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: වයිඑක්කේඅයි/එල්ඒඑන්/01/03/14 - II
2018 ජූලි මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාකියාදෙනිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/වයිකේකේ/2017/1072 හා 2017.10.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. කැබලි අක්ෂර 'ඒ' – නාකියාදෙනියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0638

උතුරට: කැබලි අක්ෂර බී; නැගෙනහිරට: වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත; දකුණට: වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී.

02. කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.1361

උතුරට: කැබලි අක්ෂර සී, ඩී, ඒ සහ වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ, ඩී සහ වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත; දකුණට: කැබලි අක්ෂර ඒ, ඩී සහ වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත; බටහිරට: කැබලි අක්ෂර සී සහ වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත.

03. කැබලි අක්ෂර 'සී' – නාකියාදෙනියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.5917

උතුරට: වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත.

04. කැබලි අක්ෂර 'ඩී' – නාකියාදෙනියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1434

උතුරට: කැබලි අක්ෂර බී; නැගෙනහිරට: වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත; දකුණට: වටවල වැව්ලි සමාගම හිමිකම් කියන නාකියාදෙනියවත්ත සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී.

10 – 164